# පිළිකුලේ සුලමුල

**රසවත් ආහාර පිරුණ භාජනයක් දැකීම රස නහර පිනායන දර්ශනයකි. අශූචි පිරුණ බඳුනක් දැකීමෙන් ඔබට ඇතිවන්නේ පිළිකුලකි. සාහිත්‍ය රස විඳීමේ දී පිළිකුල් රසයට වෙනම නමක් දී ඇත. එය 'බීභත්සය" රසය ලෙස නම් කර ඇත.**

සමස්තයක් වශයෙන් ගත් කල සියලූ දෙනාම පොදුවේ පිළිකුල් කරන දේ ගණනාවක් ඇත. අශූචි, කුණු වී ඉහඳ පණුවන් ගසා දුගඳ හමන මළ සිරුරක්, කුණු වී සැරව, ඕජස් ගලන තුවාලයක්, කථාකරන විට කටින් දුගඳ හමන කෙනෙක් ආදී වශයෙන් මෙම පොදු දේවල් නම් කළ හැක.

ඒ ඒ ජාතීන් ගත් කළද, ජාතියක් වශයෙන් පිළිකුල් කරන දේ ගණනාවක් ඇත. ලන්ඩන් විශ්ව විද්‍යාලයේ සෞඛ්‍යය සහ ඝර්ම කලාපීය වෛද්‍ය ආයතනයේ වැලරි කර්ටිස් විසින් කරන ලද සමීක්ෂණයකදී පහත සඳහන් ලබාගෙන ඇත. ඉන්දියාව,නෙදර්ලන්තය, මහා බ්‍රිතාන්‍යය, බටහිර අප්‍රිකානු රටක්වන බර්කිනා ෆැසෝ සහ ග්‍රීසියේ ඇතන්ස් නුවර ගුවන් තොටුපොල මෙමම සමීක්ෂණයට භාජනය විය. මෙහිදී පෙනී ගිය එක් කරුණක් වන්නේ ඒ ඒ රටවල් සහ ප්‍රදේශ අනුව පිළිකුල් කරන ද්‍රව්‍ය වෙනස් වන බවය.

කුලහීනයන් සහ ප්‍රසිද්ධ ස්ථානවල පෙම්වතුන් සිප ගැනීම ඉන්දියානුවන් ඉතා පිළිකුල් කළ දෙයක් විය. බොහෝ බ්‍රිතාන්‍ය ජාතිකයින් පවසා ඇත්තේ මැරී වැටී ඇති ස්පැරෝ නම් කුරුල්ලන් සහ අශ්වයන්ට වද හිංසා පැමිණ වීම පිළිකුල් කළ දෙයක් බවය. ඕලන්ද ජාතිකයෝ බල්ලන්ගෙන් වැගිරෙන කෙල



**ආචාර්ය උපාලි ඇම් සේනානායක**

සහ දේශපාලඥයින් පිළිකුල් කළහ. ඇතැන්ස් ගුවන් තොටු පොලේ මගීහු පුළුල් පරාසයක පිළිකුල් දේවල් පවසා ඇත. එය ඇඳුම් තෙමාගත් තෙත බරිත මිනිසුන්ගේ සිට ඇග ලේ උරාබොන මදුරුවන්, මකුණන් තැලීම අතර පරාසයක් විය.

එහෙත් කර්ටිස් ගේ කුතුහලය ඇවිස්සූ එක් වැදගත් විය. රට ප්‍රදේශය හෝ ලිංග භේදයකින් තොරව ඇතැම් දේ පොදුවේ පිළිකුල් කළ දේවල් විය. අශූචි (මිනිස් හෝ සත්ව) වමනය,, ඩාදිය, සහ ඩාදිය ගඳ, කැහිකාරා වමාරන, සෙම් සොටු, ලේ, සැරව, ලිංගික දියර,, ඒවා අතර විය. මීට අමතරව මීයන්,ඌරන්, පණුවන් සහ ඉහඳ පණුවන් සහ උකුණන් ද මේ පිළිකුලට භාජනය විය.

කර්ටිස් පමණක් නොව වෙනත් පරීක්ෂකයින් විසින් වරින් වර ලොව වටා කරන ලද දත්ත එකතු කිරීමේ දී පිළිකුලට භාජනය වන ඉහත සඳහන් වර්ග යළි යළිත් ඉස්මතු විය.මෙයට හේතු පරිණාමය පදනම් ව සොයාගත හැකි බව කර්ටිස් පවසයි. අශූචි වල අප්‍රසන්න ගඳ සහ වර්ණය එක් ප්‍රධාන සාධකයක් වන අතර තවත් වැදගත් විද්‍යාත්මක සාධකයක් ද ඇත. අවම වශයෙන් රෝගකාරක විෂබීජ වර්ග 20 ක් වත් අශූචි මගින් පතුරුවයි. මේවා අතර වෛරස් වර්ග බැක්ටීරියා රෝගකාරක පැතොජන් වර්ග (පෝලියෝ සිට සැල්මොනෙල්ලා වැනි) රෝග වෙයි. මේවාගෙන් මිනිසා බේරා ගැනීමට ස්වභාවයෙන්ම මිනිසා අශූචි වලට පිළිකුලක් දක්වන බව විශ්ලේෂකයෝ පවසති. බලූ කෙල වැනි සත්ව කෙලද රෝග ගණනාවක් පතුරුවා හරියි. පිස්සු බලූ රෝගයට අමතරව, හර්පිස් සිපිලිස් වැනි ලිංගික රෝග බීජ ද මේ අතර වෙයි. මැක්කන් මදුරුවන් වැනි සතුන් මහාමාරිය, මැලේරියාව, මොළයේ උණ වැනි රෝගත්, නාසයෙන් වැගිරෙන සෙම් සොටු මගින් කක්කල් කැස්ස සහ ක්ෂය රෝගය පතුරුවයි. නිරායාසයෙන්ම මෙයට පිළිකුලක් ඇතිවීම සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමට හේතුවයි. වනචාරී යුගයේ සිටම මෙබඳු දේ පිළිකුල් කිරීම සිය ඊ ළග පරම්පරාවට දයාද කරන ලදී. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ මිනිස් වර්ගයා කුමන රටකට හෝ ජාතියකට අයත් වූවත්, සමස්ථයක් වශයෙන් ඉහත සඳහන් දේවලට පිළිකුලක් ඇති වීමයි.

පරිණාමය සඳහා ජානමය පදනමක් ඇති බව පිළිගත් දෙයකි. එහෙත් මීට අමතරව පිළිකුලට හේතුවන දේ මග හැරීමට ගත යුතු ක්‍රියා මාර්ග පිළිකුල් දෙයක් දුටුවිට අපට වමනය වන්නේ ඇයි ? මෙයත් මොළයෙන් පාලනය වන්නක් නොව, ස්නායු ජාලයක් මගින් ස්වයං පාලනයකින් තොරව සිදුවන දෙයකි. ආහාර දිරවීමත් මෙබඳුම ක්‍රියාවලියකි.පිළිකුල් දෙයක් දුටුවිට හැම දෙනාටම එක ලෙස වමනය නොයයි. කෙනෙක් වැඩියෙන් වමනය කරයේ. තවෙකෙක් අඩුවෙන් වමනය කරයි. ඇතෙමෙක් වමනය නොකරයි. ආහාර මාර්ගය පුරා විහිදී ඇති

ස්නායු ජාලයක(Gutbrain ක්‍රියාවේ අඩු වැඩි වීමක් මෙයට හේතුවෙයි. බොහෝ ජීව විද්‍යාඥයින් මෙම ස්නායු ජාලය උපමා කරන්නේ කුකුළු පැටව් අහුරා තබන කම්බි දැලකටය. අපට නොදැනුවත්වම ආහාර මාර්ගය ඔස්සේ ආහාර ගමන් කර ආහාර දිරවන්නේ මෙම ජාලයේ ක්‍රියා කාරීත්වය නිසාය.

අහිතකර යමක් එනම් කුණු මස් කැබැල්ලක් පණුවෙක් හෝ අශූචි වැනි යමක් කෑම සමග මුඛයට ගත් වහාම අපට වමනය යයි. මේ අතුනු බහන් ස්නායු ජාලයේ ක්‍රියාකාරකමකි.මාංශ පේශී හැකිලී ඉදිරියට ගමන් කිරීම වෙනුවට ක්ෂණිකව ඒවා පසු පසට ක්‍රියා කර ආහාරය මුඛයෙන් පමණක් නොව ආමාශයෙනුත් පිට කර හැරීමයි. අනපේක්ෂිත ලෙස එබඳු ආහාර ශරීර ගත වූයේ නම් ගත් තැනැත්තා රෝගාතුර වනු නොඅනුමානය. එලෙසම පිළුනු ආහාරයක් මිනිසා පමණක් නොව බොහෝ සතුන් ද ප්‍රතික්ෂේප කරනු ලබයි.

කුණු මස් මාළු පමණක් නොව වෙනත් ආහාර ද (අශූචි ඇතුළුව) ඕනෑකමින් ගිල දමන සත්තු අපට දැකිය හැක. එබඳු සතුන් රෝගාතුර නොවන්නේ මන්දැයි ඔබට ප්‍රශ්නයක් වනු ඇත. මෙයට ජීව විද්‍යාඥයෝ සරල පිළිතුරක් දෙති. ඒ සතුන්ගේ ආමාශ තුළ තරලය තද ආම්ලික එකක්. එයට ඇතුළුවන ඕනෑම රෝග කාරක හෝ නොවන ක්ෂුද්‍ර ජීවීහු මියයති. මේ නිසා එබඳු සත්තු ආහාර විෂවීම නිසා මිය නොයති.

ලන්ඩන් විශ්ව විද්‍යාලයේ මානසික රෝග අංශයේ මේරි පිලිප් සහ ස්නායු රෝග අංශයේ ඇන්ඩි කෝල්ඔර් පෙන්වා දෙන්නේ "පිළිකුල" ක්‍රියාත්මක කරන ස්නායු බණ්ඩයක් මොළයේ ඇති බවයි. "බිය" හඳුනා ගන්නා මධ්‍යස්ථානය වඩා වෙනස් මධ්‍යස්ථානයකි. චුම්භක කම්පන ජායා(Magnetic Resonance Imaging)යොදා කරන ලද අධ්‍යයන වලදී එයට භාජනය වන තැනැත්තාට පිළිකුල උපදවන දේ දර්ශනය වන්නට සලස්වන ලදී. කුණු මස් මාළු, වමනය, අශූචි හෝ කැරපොත්තන් වැනි දේ පෙන්වීමේ දී මොළයේ නියමිත මධ්‍යස්ථානයක් දීප්තිමත් විය. මුහුණේ මාංශ පේශී හැකිලීමද මෙයට සමගාමීව සිදු විත. චලනය හඳුනා ගැනීම සහ ත්‍යාග ලැබීමේ දී උත්තේජනය වන මධ්‍ය ස්ථාන (Rewards) මේ සමග ගැලපිත. අනිත් මධ්‍යස්ථානය වූයේ අප යමක් රස විඳින විට උත්තේජනය වන කොටසයි. මෙම කොටස ඉන්සියුලා(Insula)ලෙස හැඳින්වෙයි.

මොළයට ශල්‍යකර්ම කරන අවස්ථාවලදී ඉන්සියුලාව කෘත්‍රිමව උත්තේජනය කිරීමෙන් රෝගියාගේ කටට කුණු රසයක් දැනුන බවත්, වමනය යෑමට හේතු වූ බවත්, වාර්තාවේ. මෙම ඉන්සීයුලා කොටසට හානි සිදු කළොත් (ඕනෑ කමින් හෝ අංශභාගය වැනි රෝගයකින්) එම තැනැත්තාට කිසිම පිළිකුලක් නොදැනේ. එබඳු තැනැත්තෙක් කිසිම පැකිලීමකින් තොරව ඕනෑම පිළිකුල් දෙයක් අනුභව කරයි. එය කුණු වූ මස් කැබැල්ලක් විය හැක. නො එසේනම් පණුවන් තම්බා මැස්සන් කීප දෙනෙක් පොඩිකර කළවම් කරන ලද සුප් එකක් විය හැක. බොහෝ අංශභාග රෝගීහු කිසිදු පිළිකුලකින් තොර මළ මූත්‍ර අතපත ගෑම සහ ඇගේ තවරා ගන්නේ ද මෙම ඉන්සියුලා කොටසට හානි සිදු වූ විටය.

මෙබඳු තැන්තන්ගේ පිළිකුලේ සීමාවක් නැත. චොකලට් පෙත්තක හැඩ ගැන්වූ බලු බෙටි කෑමට ඔවුහු කැමත්තක් දැක්වූහ. කලින් දින මළ මීනියක් තැබූ ඇඳක නිදා ගැනීමට ඔවුහු මැලි නොවූහ.

ඉන්සියුලාවේ ආබාධ ඇත්තෝ පිළිකුලේ අන්තය දක්වන ක්‍රියාවල නිරතවූහ. මෙහිදී නිරීක්ෂණයට ලක්වූ එක් කරුණක් වූයේ මෙබඳු අද පැය ගණනාවක් තම අත පය සේදූහ. නැතහොත් ඇගේ කුණු ඉවත් කිරීමට නිතර නිතර ස්නානය කළහ. බොහෝ මානසික විද්‍යාඥයින් මෙය දකින්නේ බිය සහ අසහනදායක හැඟීම් ප්‍රමාණයට වඩා ක්‍රියාත්මක වීම නිසා මෙබඳු හැසිරීම් රටා දක්වන බවයි. එහෙත් ෆිලිප් සහ වෙනත් පර්යේෂකයින්ගේ පර්යේෂණවලින් පෙනී යන්නේ පිළිකුලේ අස්වාභාවික ස්වරූපයක් නිසා එබඳු හැසිරීම් රටාවක් දක්වන බවය.

**මොළයට ශල්‍යකර්ම කරන අවස්ථාවලදී ඉන්සියුලාව කෘත්‍රිමව උත්තේජනය කිරීමෙන් රෝගියාගේ කටට කුණු රසයක් දැනුන බවත්, වමනය යෑමට හේතු වූ බවත්, වාර්තාවේ. මෙම ඉන්සීයුලා කොටසට හානි සිදු කළොත් (ඕනෑ කමින් හෝ අංශභාගය වැනි රෝගයකින්) එම තැනැත්තාට කිසිම පිළිකුලක් නොදැනේ. එබඳු තැනැත්තෙක් කිසිම පැකිලීමකින් තොරව ඕනෑම පිළිකුල් දෙයක් අනුභව කරයි. එය කුණු වූ මස් කැබැල්ලක් විය හැක.**

මෙබඳු රෝගීන් ගණනාවක් MRIපරීක්ෂණයට භාජනය කරන ලදී. එම පරීක්ෂණවලට භාජනය කරනවිට සාමාන්‍ය සිත්තම්, මුතු මැණික් , රන් පළඳනා වැනි දේත් නරක් වූ ආහාර, කුණු වී ඕජස් ගලන මළ මිනීත්, ලේ සැරව ගලන තුවාලත්, (මෙම පින්තූර නියත වශයෙන් පිළිකුල් සහගත විය) මායිම් තත්වයේ ඇති කුණු පිරුන භාජන වැරහැලි ඇඳගත් පුද්ගලයින් ගේ පින්තූර පෙන්වන ලදී. MRIපරීක්ෂණ පින්තූරවලින් පෙනී ගියේ, සම්මත වශයෙන් පිළිගත් පිළිකුල උපදවන පින්තූර සාමාන්‍ය පුද්ගලයින් තුළ පිළිකුලක් ඇති වූ බවය. ප්‍රමාණයට වඩා ඉන්සියුලාව ක්‍රියා කරන අය මායිම් තත්ත්වයේ ඇති කුණු පිරුණ භාජන, වැරහැලි ඇඳගත් තැනැත්තන්ගේ පින්තූර දකින විට පවා මහා පිළිකුලක් පෙන්වමින් මොළයේ ඉන්සියුලාව දීප්තිමත් වූ බවක් පෙන්වීය.

ස්කොට්ලන්තයේ ශාන්ත ඇන්ඩෘ විශ්ව විද්‍යාලයේ ස්නායු විද්‍යාඥයෙක් වන රේනර් ස්ප්‍රෙන්ගෙල් මේයර් නම් පර්යේෂණ ගණනාවක් කර ඇත. අසාමාන්‍ය ලෙස ඉන්සියුලාව ක්‍රියාකාරී රෝගීන්ට විවිධ දේ පෙන්නුම් කරන පින්තූර ගණනාවක් පෙන්වන ලදී. මෙම පින්තූර අතර ප්‍රීතිය, සුදු මස්, බිය,දුක, පිළිකුල සහ තරහ විදහාපාන පින්තූර විය. මෙම සියලු රෝගීන්ට පිළිකුල බිය සහ තරහ වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට අපහසු විය.

මෙම පර්යේෂණ තීරණාත්මක නොවුවද මොළයේ හැඟීම් රටාව තේරුම් ගැනීමට උදව් වී ඇත. මෙම හැඟීම් වලට පදනම් ස්නායු සම්බන්ධතාවය තේරුම් ගත් පසු එය නවතා දමන හෝ පාලනය කරන බෙහෙත් නිපදවීම පහසුය. එබඳු ඖෂධ චිකිත්සක ක්‍රම ලොව වටා ඇති රෝගීන්ට මහත් අස්වැසිල්ලක් වනු ඇත.

පිළිකුල ඇතිකරන දර්ශනත්, සිත වශී කරන දර්ශනත්, අතර ඇත්තේ පටු වෙනසකි. ඇතැම් විට පිළිකුල ඇති කරන දර්ශන සිත වශී කරන අවස්ථාද ඇත. මෑත්හැටත් කෞතුකාගාරයේ කෘත්‍රිම සාදන ලද ආහාර ජීර්ණ පද්ධතියක් වෙයි. බෙල්ජියම් ශිල්පියෙක් නිර්මාණය කර ඇති මෙය නම් කර ඇත්තේ Cloaca නමිනි. එහි සිංහල තේරුම අධෝමුඛය යන්නයි. ජීර්ණ පද්ධතියේ සියලු ක්‍රියා (එන්සයිම ඇතුව) එහි විදහා දැක්වෙයි. මුඛය වැනි කොටසට ඇතුලු කරන රසවත් ආහාර එහි දීර්ඝ ගමනකට පසු පසුපස කෙළවරින් පිටවන්නේ කහ පැහැති අශූචි ලෙසය. මෙම නිර්මාණය දකින බොහෝ දෙනා තුළ කුතුහලය සිත වශී කිරීම සහ පිළිකුල එකවිටම වාගේ උපදී.

පිළිකුල පිළිබඳව විශේෂ ග්‍රන්ථයක් චාල්ස් ඩාවින් විසින් 1872 දී පල කරන ලදී. එය නම්කර ඇත්තේ "මිනිසා" සහ සතුන් තුළ හැඟීම් ප්‍රකාශ කිරීම යන තේරුම් ඇති "The Expression of the Emotions in Man and Animals "යනුවෙනි. එබඳු ඈත අතීතයේ පටන්ම හැඟීම් සහ හැසිරීම් රටාව පිළිබඳව කුතහලය ඇතිවී තිබේ. MRIයන්ත්‍රය නිපදවීමක් සමගම එහි විද්‍යාත්මක පැත්ත ගැන නතු සෙවීමට හැකිවී ඇත. ❑